# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,924/2 — 1970 සැප්තැම්බර් 20 වැනි ඉරිද — 1970.9.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## පළාත් පාලන නිවේදන

### ගමසභා ආඥපනතේ (257 අධිකාරය)

**17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

ගමසභා ආඥපනතේ (257 අධිකාරය) 17 වැනි වගන්තිය යටතේ 1970 සැප්තැම්බර් මස 11 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් නිවේදනය කර ඇති පරිදි 1970.9.19 වැනි දිනට පැවැත්වීමට තිබූ අම්පාර ප්‍රදේශය අක්කරයිපත්තු මධ්‍යම ගමසභාවේ 1 වැනි සභා වාරයේ රැස්වීම මෙයින් අවලංගු කර ඇති බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇන්ටන් ඇල්ප්‍රඩ්,
පළාත් පාලන සහකාර කොමසාරිස්.,
අම්පාර දිසාව.

1970 සැප්තැම්බර් මස 17 වැනි දින,
කල්මුනේ.

9–1077/1

---

### ගමසභා ආඥපනත

**17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

1961 අංක 60 දරණ පණතින් සංශෝධිත ගමසභා ආඥපනතේ (257 අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අම්පාර දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් ඇන්ටන් ඇල්ප්‍රඩ් වන ම විසින්, මෙයට යාකොට ඇති උපලේඛනයේ පළමුවැනි තීරුවෙහි දක්වෙන එක් එක් ගමසභාවේ ප්‍රථම රැස්වීම, එකී උපලේඛනයේ දෙවැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත දිනයෙහි දී, එකී උපලේඛනයෙහි තෙවැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත වේලාවට ද, එකී උපලේඛනයෙහි සිවුවැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත ස්ථානයේදී ද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඇන්ටන් ඇල්ප්‍රඩ්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
අම්පාර දිසාව.

1970 සැප්තැම්බර් මස 17 වැනි දින,
කල්මුනේ පිහිටි, අම්පාර දිසාවේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| පළමුවෙනි තීරුව | දෙවෙනි තීරුව | තෙවෙනි තීරුව | සිවුවෙනි තීරුව |
|---|---|---|---|
| ගමසභාවේ නම | දිනය | වේලාව | ස්ථානය |
| අක්කරයිපත්තු මධ්‍යම ගම සභාව ... | ... 1970.9.30 ... | පෙරවරු 10 ... | අක්කරයිපත්තු මධ්‍යම ගමසභා කාර්යාලයය. |

9–1077/2

---

### ගමසභා ආඥපනත

**17 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගමසභා ආඥපනතේ 17(5) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලේකම් වසම් ගොඩ්වින් සිරිවර්ධන වන ම විසින්, 1970 සැප්තැම්බර් මස 27 වැනි දින පස්වරු 2 ට මතුරට පිහිටි උඩගම්පහ ගමසභා කාර්යාලයේදී නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ උඩගම්පහ ගමසභාවේ රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

එල්. පී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්.,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1970 සැප්තැම්බර් මස 12 වැනි දින,
නුවරඑළිය, පළාත් පාලන කාර්යාලයේදීය.

9–1078

ඇල්.ඩී.—බී. 113/46

## සුළු නගර සභා ආඥාපනත

1967 අංක 2 දරන පනතින් සංශෝධිත (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 10(2) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ වැඩබලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති.

1970 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

කල්පිටිය සුළු නගර සභාවේ දැනට නිල දරන සභිකවරුන්ගේ නිල කාලය අවසන් විය යුතු දිනය වශයෙන් 1970 දෙසැම්බර් මස 31 වැනි දිනය වෙනුවට 1971 ජූනි මස 30 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

9–1079

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.